## 2019 මාර්තු මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**"එතුමාණන් ඔබට කියන කොයි දෙයක් වුව ද කරන්න "** (ශු.ජොහාන් 2:5)

කිතු දන පුබුදුව තුළ අයැදීම් සේවකයන් වශයෙන් අපගේ දූත කාර්යය නම්, අපගේ පෞද්ගලික අවශ්‍යතා සඳහා නොව, අන් අයගේ පොදු අවශ්‍යතා සඳහාත්, පුබුදු සංවිධානය ඉදිරියට ගෙන යෑම සඳහාත්, ශුද්ධවූ සභාව වෙනුවෙන් - රට වෙනුවෙන් - සමස්ථ ලෝකය සහ ශුද්ධිකාගිනිස්ථානයේ ආත්ම ගැලවීම සඳහාත්, රට තුළ ඇතිවන අර්බුද සහ වසංගතයන් වෙනුවෙන් සාංඝිකව යාච්ඤා කිරීමයි. මේ සියල්ල ජේසු ක්‍රිස්තුන් වහන්සේ හා ඒකාබද්ධව ඔවුන් වහන්සේගේ මැදිහත් කමට සම්බන්ධ වීමයි.

මෙය වඩාත් අර්ථවත් වන්නේ පුබුදුවේ ජීවමාන සම්ප්‍රදාය තුළින් අපට ලැබී ඇති පුබුදු කැරිස්මාවට ඇතුළු වී අපගේ මූලික ප්‍රමුඛතා වන මගේ පැය, නිරන්තරයෙන් ශුද්ධාත්මයාණන්ට අවදිවීම, (ශු.ප්‍රවාම් 14:16-17) පස් වැදෑරුම් අත්දැකීම, ප්‍රශංසා එකතුව, සාංඝික පවුල් දිනය, පුබුදු ඉගැන්වීම් සහ ඥානකාන්තිවලට සහභාගි වීම, සරල අල්පේච්ඡ ජීවිතය, දිව්‍ය පූජාවට සූදු ඇඳීම, දිව්‍ය පූජාවට අර්ථාන්විතව සහභාගි වීම, පාපොච්චාරණය හෙවත් කතෝලික ජීවමාන සම්ප්‍රදායන්ට ගරු කිරීමයි.

මෙම මස 06 වන දින අළු බදාදායින් චතාරික සමය ඇරඹේ. මෙම චතාරික සමය අර්ථවත්ව ගත කිරීමට අපි අධිෂ්ඨාන කළ යුතු අතර, පුබුදු ජනතාව ඇතුළු සමස්ත කිතුනු ජනතාවටම මෙම චතාරිකය අර්ථවත්ව ගත කිරීමට අවැසි ශුද්ධාත්ම බලය පතා මේ මාසය පුරාවටම යාච්ඤා කරමු. මැදිහත් වෙමු.

එමෙන්ම මේ මාසය තුළ අපට ලැබී ඇති තේමා වචනය වන **"එතුමාණන් ඔබට කියන කොයි දෙයක් වුව ද කරන්න"** යන වදන මුල් කරගෙන විශේෂයෙන් මේ මාසය භාග්‍යවන්ත අම්මා හා එකතුව ජපමාලයට මුල් තැන දෙමින් අන් අය වෙනුවෙන් යාච්ඤා කරමු. විශේෂයෙන් මරියතුමියව ප්‍රතික්ෂේප කරන මූලධර්මවාදීන්ගේ සිත් හැරීම උදෙසාත් යාච්ඤා කරමු. මේ මාසය තුළ හැකි සෑම කෙනෙකුම දහවල් 12.00ට ඉන්න තැන ඉඳගෙන ජපමාලය ඔප්පු කිරීමට තීරණයක් ගනිමු. විශේෂයෙන් මනස්ස්ථාපනය නොවන පව්කරුවන් වෙනුවෙන් මැදිහත් වෙමු.

> **" ඔබ කෙතරම් පහතට වැටී ඇද්දැයි සිහියට ගෙන, පසුතැවී සිත් හරවා ගන්න. මුලින් කළ ක්‍රියා නැවත කරන්න. එසේ නොකළොත්, පසුතැවී සිත් හරවා නොගතහොත්, මම ඔබ වෙත පැමිණ, ඔබේ පහන් රුක තිබෙන තැනින් ඉවත් කරන්නෙමි."** (එළිදරව් 2:5)

පළමු සතිය - දිව්‍යමය කියවීම : ශු.ප්‍රවාම් 2:1-10

අයැදීමට විශේෂ යොමුව :

ඇරඹෙන්නාවූ චතාරික සමය අර්ථවත්ව ගත කිරීමට සමස්ථ පුබුදු ජනතාව ඇතුළු සෑම කිතුනුවෙකුටම අවැසි ශුද්ධාත්ම ප්‍රඥාව ඉල්ලා අයැදීම. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* ස්වාමි තාත්තා වෙනුවෙන්. එතුමන් අපට ඉදිරිපත් කළ පුබුදු වටිනාකම ඉදිරියට ගෙන යෑමට අවැසි ශුද්ධාත්ම බලය පතා අයැදිමු.
* මනස්ස්ථාපනය නොවන පව්කරුවන් වෙනුවෙන්.
* දිවැසි එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* විවිධ දෙවි දේවතාවන් හඹා යන කිතුනුවන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම් .....

දෙවන සතිය - දිව්‍යමය කියවීම : එපීස 1:7-12

අයැදීමට විශේෂ යොමුව :

මත්පැන්, මත් ද්‍රව්‍ය ඇතුළු අපචාරයන්ට හසු වූ අය සහ පාතාල කල්ලිවලට සම්බන්ධ අයගේ ජීවිත වෙනසක් ඇතිවීම සඳහා (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* මේ දිනවල චතාරික භාවනාවට ඇතුළු වී සිටින සියළු දෙනාත්, චතාරික කාලයේ උපවාසයෙන් සහ යාච්ඤාවෙන් ජීවිත වෙනසක් ඇති කර ගැනීමට උත්සාහ කරන සියළු දෙනා වෙනුවෙන්.

* විවිධ වසංගත රෝගවලින් පෙළෙන අය සහ පිලිකා, වකුගඩු, හෘදයාබාධවලින් පෙළෙන අය සඳහා.
* කුඩා දරුවන්, තරුණ-තරුණියන්, ශිෂ්‍ය - ශිෂ්‍යාවන් වෙනුවෙන්.
* ගර්භනී මව්වරු වෙනුවෙන්.
* වෙනත් අයැදීම්.....

තෙවන සතිය - දිව්‍යමය කියවීම : එපීස 2:1-10

අයැදීමට විශේෂ යොමුව :

2018 නොවැම්බර් මස ප්‍රශංසාරාමයේ පැවැති යැදුම් සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කළ අදහස් වලින් ලැබුණු ආලෝකයේ වචන ඉදිරියට ක්‍රියාත්මක වීම සඳහා යාච්ඤා කරමු. (විනාඩි 10ක් පමණ)

සාංඝිකවලට යවා ඇති පත්‍රිකාව උදව් කර ගන්න. (දිව්‍ය පූජාවට සුදු ඇඳීම, වචනයේ සේවකයන් සුදු ඇඳීම, සිකුරාදා දිනවල උපවාසයේ සහ යාච්ඤාවේ දිනයන් ලෙස ගත කිරීම, බ්‍රහස්පතින්දා පවුල් යාගය, අල්පේච්ඡ ජීවිතය, පරිසරයට ආදරය කිරීම, වෙලාවට වැඩ කිරීම, පොලිතින් ප්‍රතික්ෂේපය.

වෙනත් අයැදීම් :
* පූජක, පැවිදි සහ ධර්මදූත සේවාවේ නියැලෙන සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම් .....

සතරවන සතිය - දිව්‍යමය කියවීම : 2 කොරින්ති 5:17-21

අයැදීමට විශේෂ යොමුව :

දේශය වෙනුවෙන් (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් :
* විදේශ රටවල පුබුදු සංඝයන් සහ ඒ ඒ සාංඝිකවල අයැදීම් එකතුවලට සම්බන්ධ අය වෙනුවෙන්.
* සුබැඳි, සබැඳි, සුරැඳි, සුමැදි සංඝයන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම්.....

**"එබැවින් යමෙක් ක්‍රිස්තුන් වහන්සේ තුළ සිටී නම්, එතැන ඇත්තේ නව මැවිල්ලකි. පැරණි දේ පහ ව ගොස් ඇත. දැන් සියල්ල ම අළුත් වී තිබේ."**
(2 කොරින්ති 5:17)

අවධානය සඳහා :
* සුපුරුදු ලෙස සිකුරාදා දිනය උපවාසයේ සහ යාච්ඤාවේ දිනයක් ලෙස ගත කරන්න.
* දිනපතා දහවල් 12.00ට සිටින තැන සිට පව්කරුවන්ගේ සිත් හැරීම සඳහා ජපමාලය උච්ඡාරණය කරන්න.

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

******************************